## බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම
## 2015 සැප්තැම්බර් මස 22 වන දින පෙ.ව. 9.30 ට

### න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

IX. සභාවේ කටයුතු - I

<u>සභා කටයුතු පිළිබඳ විෂය භාර අමාත්‍යවරයා (බ.ප.)</u>

**යෝජනාව :**

"අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය."

### සභාවේ කටයුතු - II

<u>සභා කටයුතු පිළිබඳ විෂය භාර අමාත්‍යවරයා (බ.ප.)</u>

**යෝජනාව :**

"අද දින (2015.09.22) න්‍යාය පත්‍රයේ, පොදු කටයුතු විෂයය යටතේ සඳහන් විෂයයන්හි අනු පිළිවෙළ විෂයය අංක 06, 07, 01, 02, 03, 04 හා 05 යන පරිදි විය යුතු යැයි සළකා ක්‍රියා කළ යුතුය."

# X. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

## 01. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා :

"බස්නාහිර පළාත තුළ මේ වන විට පාසැල් දරුවන්ගෙන්, දෙමාපියන්ගෙන් විටින්විට මුදල් අය කිරීම් සිදු වේ. පළමුවන ශ්‍රේණිය, හයවන ශ්‍රේණිය සහ දොළොස්වන ශ්‍රේණිය සඳහා දරුවන් ඇතුළත් කර ගැනීමේදී මෙන්ම වෙනත් පන්තිවල අවශ්‍යතා සඳහාද දරුවන්ගේ දෙමව්පියන්ගෙන් මෙලෙස මුදල් එකතු කිරීම නිසා ඔවුන් දැඩි දුෂ්කරතාවයකට පත් වී ඇත. එබැවින් බස්නාහිර පළාත තුළ දරුවන්ගේ දෙමව්පියන්ගෙන් මුදල් එකතු කිරීම (පහසුකම් ගාස්තු හැර) නතර කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."

(යෝ/VI(1)/14/09)

## 02. ගරු ලක්ෂමන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා :

"බස්නාහිර පළාත් පාසැල් සඳහා 1 වන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීමේදී දරුවන් හා දෙමව්පියන් පීඩාවට පත් කරන වර්තමාන ක්‍රමවේදය වෙනස් කිරීමේ අවශ්‍යතාවය මතුව ඇත. ඒ සඳහා දරුවන් පාසලට ඇතුළත් කර ගන්නා දින සිට මාසයක් ඉක්ම යාමට පෙර සියලු පුරප්පාඩු පුරවා අවසන් කිරීමත්, ආරක්ෂක අංශවල සේවයේ නියුක්ත වූවන්ගේ දරුවන්ගේ නාම ලේඛනය දරුවන් ඇතුළත් කර ගත් දිනයේ සිට සති 03 ක් ඉක්ම යාමට පෙර පළාත් සභාවට ලැබීමට සැලැස්වීමත්, පාලක පක්ෂ මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන නාම ලේඛනයට අනුව ළමුන් ඇතුළත් කර ගන්නා ක්‍රමය අහෝසි කිරීමත්, සම්මුඛ පරීක්ෂණවලට සහභාගි වන සෑම දරුවෙකුටම ලැබෙන ලකුණු අනුව ස්ථිර ලේඛනයක් ලකුණු අනුපිළිවෙළට අනුව සකස් කිරීමත් ලබා ගන්නා ලකුණු අනුපිළිවෙලට අනුව පාසලට දරුවන් ඇතුළත් කිරීමට පියවර ගැනීමත් කළ යුතු යැයි ද, ඒ අනුව බස්නාහිර පළාතේ පාසැල්වල පළමුවන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේ කටයුතු විධිමත් කර පාසලකට දරුවෙකු ඇතුළත් කිරීමට තිබෙන මානව අයිතිය පළාතේ ජනතාවට තහවුරු කළ යුතු යැ'යි ද මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි. "

(යෝ/VI(1)/14/10)

# XI. පොදු කටයුතු

## 01. පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා (බ.ප) :

**යෝජනාව :**

**මීගමුව මහ නගර සභා බල ප්‍රදේශය තුළ පෞද්ගලික පොළවල් විධිමත් කිරීම, පාලනය කිරීම, පරිපාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

"1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරිය වන මහ නගර සභා ආඥා පනතේ 268 වන වගන්තිය යටතේ එවකට බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලිබල හා බලශක්ති, මිනිස්බල හා රැකි රක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍යවරයා වශයෙන් පැවරී ඇති බලතල අනුව අනුමත කරනු ලැබ,

එම අනුමැතිය පිළිබඳ නිවේදනය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1622/21 දරන හා 2009.10.07 වැනි දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද,

මීගමුව මහ නගර සභාව විසින් 252 අධිකාරය වන මහ නගර සභා ආඥා පනතේ 267 වන වගන්තිය යටතේ සාදනු ලැබූ, **"මීගමුව මහ නගර සභා බල ප්‍රදේශය තුළ පෞද්ගලික පොළවල් විධිමත් කිරීම, පාලනය කිරීම, පරිපාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා"** නම් වූ අතුරු ව්‍යවස්ථා,

ඉහත කී 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරය වන මහ නගර සභා ආඥා පනතේ 268 වන වගන්තිය යටතේ ස්ථිර කළයුතු යැ'යි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කරයි' යන යෝජනාව කරමින්ම, එකී අතුරු ව්‍යවස්ථාවන්, මෙම පළාත් සභාවට 2015.06.09 දින ඉදිරිපත් කර ඇති අතර,

ඉදින්, එදින, එහි දී ගත් තීරණය පරිදි, 2015.07.09 දින පැවැති ප්‍රඥප්ති හා නීති කාරක සභාවේදී ඒ පිළිබඳව තවදුරටත් සාකච්ඡා කර, එම කාරක සභා නිර්දේශ ඇතුළත් වාර්තාව, 2015.07.21 දින මෙම පළාත් සභාවට පිළිගන්වන ලද හෙයින්, එම අතුරු ව්‍යවස්ථාව සම්බන්ධයෙන් ලද එම කාරක සභා නිර්දේශ පිළිබඳව ද සැලකිලිමත් ව ක්‍රියා කළ යුතුය."

## 02. පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා (බ.ප) :

**යෝජනාව :**

**<u>මීගමුව මහ නගර සභා බල ප්‍රදේශය තුළ මහ නගර සභාව මගින් පාලනය වන වීථිවල විවිධ රාජ්‍ය/අර්ධ රාජ්‍ය/සංස්ථා/මණ්ඩල සමාගම් හා පුද්ගලයින් විසින් ජලනල එලීම හා භූගත රැහැන් ඇදීම පාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා</u>**

"1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 252 අධිකාරිය වන මහ නගර සභා ආඥා පනතේ 268 වන වගන්තිය යටතේ, එවකට බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලිබල හා බල ශක්ති, මිනිස්බල හා රැකී රක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍යවරයා වශයෙන් පැවරී ඇති බලතල අනුව අනුමත කරනු ලැබ,

එම අනුමැතිය පිළිබඳ නිවේදනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1622/21 දරන හා 2009.10.07 වැනි දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද,

මීගමුව මහ නගර සභාව විසින්, 252 අධිකාරිය වන මහ නගර සභා ආඥා පනතේ 267 වන වගන්තිය යටතේ සාදනු ලැබූ, **<u>"මීගමුව මහ නගර සභා බල ප්‍රදේශය තුළ මහ නගර සභාව මගින් පාලනය වන වීථිවල විවිධ රාජ්‍ය/අර්ධ රාජ්‍ය/සංස්ථා/මණ්ඩල/සමාගම් හා පුද්ගලයින් විසින් ජලනල එලීම හා භූගත රැහැන් ඇදීම පාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා"</u>** නම් වූ අතුරු ව්‍යවස්ථා,

ඉහත කී 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 252 අධිකාරිය වන මහ නගර සභා ආඥා පනතේ 268 වන වගන්තිය යටතේ ස්ථිර කළ යුතු යැ'යි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කරයි' යන යෝජනාව කරමින්ම, එකී අතුරු ව්‍යවස්ථාවන් මෙම පළාත් සභාවට 2015.06.09 දින ඉදිරිපත් කර ඇති අතර,

ඉදින්, එදින, එහි දී ගත් තීරණය පරිදි, 2015.07.09 දින පැවැති ප්‍රඥප්ති හා නීති කාරක සභාවේදී ඒ පිළිබඳව තවදුරටත් සාකච්ඡා කර, එම කාරක සභා නිර්දේශයන් ඇතුළත් වාර්තාව, 2015.07.21 දින මෙම පළාත් සභාවට පිළිගන්වන ලද හෙයින්, එම අතුරු ව්‍යවස්ථාව සම්බන්ධයෙන් ලද එම කාරක සභා නිර්දේශ පිළිබඳව ද සැලකිළිමත් ව ක්‍රියා කළ යුතුය."

## 03. පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා (බ.ප) :

යෝජනාව :

**<u>මීගමුව මහ නගර සභා බල ප්‍රදේශය තුළ එම සභාව මගින් පාලනය වන වීථිවල විවිධ රාජ්‍ය/අර්ධ රාජ්‍ය/සංස්ථා/ මණ්ඩල, සමාගම් හා පුද්ගලයන් විසින් ඉදි කරනු ලබන කණු හා ස්ථම්භ සවි කිරීමේ කාර්යය පාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා</u>**

"1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 252 අධිකාරිය වන මහ නගර සභා ආඥා පනතේ 268 වන වගන්තිය යටතේ එවකට බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලිබල හා බලශක්ති, මිනිස්බල හා රැකී රක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍යවරයා වශයෙන් පැවරී ඇති බලතල අනුව අනුමත කරනු ලැබ,

එම අනුමැතිය පිළිබඳ නිවේදනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1622/21 දරන හා 2009.10.07 වැනි දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද,

මීගමුව මහ නගර සභාව විසින් 252 අධිකාරිය වන මහ නගර සභා ආඥා පනතේ 267 වන වගන්තිය යටතේ සාදනු ලැබූ, **<u>"මීගමුව මහ නගර සභා බල ප්‍රදේශය තුළ එම සභාව මගින් පාලනය වන වීථිවල විවිධ රාජ්‍ය/අර්ධ රාජ්‍ය/සංස්ථා/ මණ්ඩල, සමාගම් හා පුද්ගලයින් විසින් ඉදි කරනු ලබන කණු හා ස්ථම්භ සවි කිරීමේ කාර්යය පාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා"</u>** නම් වූ අතුරු ව්‍යවස්ථා,

ඉහත කී 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 252 අධිකාරිය වන මහ නගර සභා ආඥා පනතේ 268 වන වගන්තිය යටතේ ස්ථිර කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කරයි" යන යෝජනාව කරමින්ම, එකී අතුරු ව්‍යවස්ථාවන්, මෙම පළාත් සභාවට 2015.06.09 දින ඉදිරිපත් කර ඇති අතර,

ඉදින්, එදින, එහි දී ගත් තීරණය පරිදි, 2015.07.09 දින පැවැති ප්‍රඥප්ති හා නීති කාරක සභාවේදී ඒ පිළිබඳව තවදුරටත් සාකච්ඡා කර, එම කාරක සභා නිර්දේශ ඇතුළත් වාර්තාව, 2015.07.21 දින මෙම පළාත් සභාවට පිළිගන්වන ලද හෙයින්, එම අතුරු ව්‍යවස්ථාව සම්බන්ධයෙන් ලද එම කාරක සභා නිර්දේශ පිළිබඳව ද සැලකිලිමත් ව ක්‍රියා කළ යුතුය.

## 04. පළාත් පාලන හා විෂය භාර අමාත්‍යවරයා (බ.ප) :

**යෝජනාව :**

**<u>බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලද කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා</u>**
**<u>(බස්නාහිර පළාතේ නගර සභා බල ප්‍රදේශයන්ට අදාළව)</u>**

"1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ 1 වන උප වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් සාදනු ලැබ,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1888/46 හා 2014.11.14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් අනතුරුව, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේම 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ අනුමත කළ යුතු යැ'යි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කරයි' යන යෝජනාව කරමින් ම 2015.06.09 දින මෙම පළාත් සභාවට ඉදිරිපත් කරන ලද කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා,

එනම් ඒ අතුරු ව්‍යවස්ථා කවරේද යත්,

i. නගර සභා බල ප්‍රදේශයේ සැරසිලි විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
ii. නගර සභා බල ප්‍රදේශය තුළ බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
iii. නගර සභා බල ප්‍රදේශය තුළ පීඩාකාරී ව්‍යාපාර, අන්තරායදායක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරායදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
iv. නගර සභා බල ප්‍රදේශය තුළ හෝටල් හා ලැගුම්හල් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.
v. නගර සභා බල ප්‍රදේශය තුළ ආදාහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
vi. (නගර සභා බල ප්‍රදේශය තුළ) භෝජන ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.
vii. නගර සභා බල ප්‍රදේශය තුළ මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.
viii. නගර සභා මාර්ගයන් හි බර හා වේග සීමා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.
ix. නගර සභා බල ප්‍රදේශය තුළ සංචාරක වෙළඳාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව.
x. (නගර) සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.
xi. නගර සභා බල ප්‍රදේශය තුළ ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.
xii. නගර සභා සේවාවන් සඳහා ගාස්තු අය කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව.
xiii. නගර සභා බල ප්‍රදේශයේ ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.
xiv. නගර සභා බල ප්‍රදේශය තුළ මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

xv. නගර සභා බල ප්‍රදේශය තුළ අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

යන අතුරු ව්‍යවස්ථාවන්,

එදින, එනම් 2015.06.09 දින, පළාත් සභා රැස්වීමේදී ගත් තීරණය පරිදි, 2015.07.09 දින පැවැති ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කිරීමෙන් අනතුරුව, එම කාරක සභාව විසින් කරන ලද නිර්දේශයන් පිළිබඳවද සැලකිලිමත්ව, අනුමත කළ යුතු යැ'යි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කරයි."

## 05. පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා (බ.ප) :

**යෝජනාව :**

**<u>බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලද කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා</u>**
**<u>(බස්නාහිර පළාතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්ට අදාළව)</u>**

"1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ 1 වන උප වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් සාදනු ලැබ,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1888/47 හා 2014.11.14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් අනතුරුව, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේම 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ අනුමත කළ යුතු යැ'යි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කරයි' යන යෝජනාව කරමින් ම 2015.06.09 දින මෙම පළාත් සභාවට ඉදිරිපත් කරන ලද කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා,

එනම් ඒ අතුරු ව්‍යවස්ථා කවරේද යත්,

i. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සැරසිලි විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
ii. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
iii. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පීඩාකාරී ව්‍යාපාර, අන්තරායදායක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරායදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
iv. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ හෝටල් හා ලැගුම්හල් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.
v. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ආදාහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
vi. (ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ) භෝජන ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.
vii. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.

viii. ප්‍රාදේශීය සභා මාර්ගයන් හි බර හා වේග සීමා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.

ix. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංචාරක වෙළඳාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව.

x. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.

xi. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.

xii. ප්‍රාදේශීය සභා සේවාවන් සඳහා ගාස්තු අය කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව.

xiii. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.

xiv. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

xv. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

යන අතුරු ව්‍යවස්ථාවන්,

එදින, එනම් 2015.06.09 දින, පළාත් සභා රැස්වීමේදී ගත් තීරණය පරිදි, 2015.07.09 දින පැවැති ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කිරීමෙන් අනතුරුව, එම කාරක සභාව විසින් කරන ලද නිර්දේශයන් පිළිබඳවද සැලකිලිමත්ව, අනුමත කළ යුතු යැ'යි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කරයි."

## 06. මුදල් විෂය භාර අමාත්‍යවරයා (බ.ප) :

**යෝජනාව :**

### <u>2015 පරිපූරක ඇස්තමේන්තුව - 01</u>

"බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, කාර්යාල, පළාත් පාලන ආයතන හා ව්‍යවස්ථාපිත ආයතන සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 24/2014, 24/2014(1) හා 5/2015 මගින් වැඩි කරන ලද අන්තර් දීමනා ගෙවීම හා අවශ්‍යයෙන්ම ගෙවිය යුතු වැටුප්, ගුරු හිඟ වැටුප් හා දීමනා ගෙවීමට අවශ්‍ය අමතර ප්‍රතිපාදන සළසා දීමද,

අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගුරුවරුන්ගේ /නිලධාරීන්ගේ දේපළ ණය පොළී ගෙවීම සඳහා අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන සැලසීම සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අතිරේක පුනරාවර්තන ප්‍රතිපාදන සැලසීමද,

අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍ර වෙනුවෙන් 2014 වර්ෂයේදී ලෝක බැංකු ආධාර යටතේ ලබා දෙන ලද මුදලින් වියදම් නොවී ඉතිරි වූ මුදල් එම ක්ෂේත්‍රවල සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා යෙදවීමට අවශ්‍ය ප්‍රතිපාදන සැලසීමද යන අවශ්‍යතා වෙනුවෙන්,

2015 වර්ෂයේදී පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ යුතුව ඇති හෙයින්, රජයේ ප්‍රදාන රුපියල් 7,508,132,000/- ක් හා 2014 වර්ෂයේ ලෝක බැංකු ආධාර යටතේ රජයෙන් ලද ප්‍රදාන ඉතිරිවීම් රුපියල් 118,142,000/- ක්ද වන පරිදි වූ මූල්‍ය මාර්ගවලින් පියවා ගැනීමට අපේක්ෂිතව පුනරාවර්තන වියදම රුපියල් 7,508,132,000/- ක් හා මූලධන වියදම් රුපියල් 118,142,000/- ක් වශයෙන් වූ මුළු ප්‍රතිපාදනය රුපියල් හත්සිය හැට දෙකෝටි හැට දෙලක්ෂ හැත්තෑ හතර දහසක්

(රුපියල් 7,626,274,000/- ක්) ව න පරිදි පිළියෙල කරන ලද 2015 පරිපූරක ඇස්තමේන්තුව - 01 අනුමත කළ යුතුය."

[2015 පරිපූරක ඇස්තමේන්තුව - 01 නමැති කෙටුම්පත් ලේඛනය 2015.09.08 දිනට නියමිතව තිබුණු සභා රැස්වීමේ න්‍යාය පත්‍රය සමඟ ම ගරු මන්ත්‍රීවරුන් වෙත ලැබෙන්නට සලස්වා ඇත.]

**07. මුදල් විෂය භාර අමාත්‍යවරයා (බ.ප) :**

**යෝජනාව :**

**2015 පරිපූරක ඇස්තමේන්තුව - 01 ට අදාළ විසර්ජන ප්‍රඥප්තිය**

"2015 වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තුව - 01 සඳහා අවශ්‍ය රුපියල් හත්සිය හැට දෙකෝටි හැට දෙලක්ෂ හැත්තෑ හතර දහසක් (රු.7626,274,000/-) වූ මුදල බස්නාහිර පළාත් සභා අරමුදලින් ගෙවීමටත්, එකී බස්නාහිර පළාත් සභා අරමුදලට ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් ප්‍රදාන වශයෙන් හෝ වෙනත් ආකාරයකින් ලැබෙන මුදල් භාර ගැනීමටත් බලය දෙනු ලබන 2015 අංක .... දරන විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය."

["2015 පරිපූරක ඇස්තමේන්තුව - 01 ට අදාළ විසර්ජන ප්‍රඥප්තිය - කෙටුම්පත" 2015.09.08 දිනට නියමිතව තිබුණු සභා රැස්වීමේ න්‍යාය පත්‍රය සමඟ ම ගරු මන්ත්‍රීවරුන් වෙත ලැබෙන්නට සලස්වා ඇත.]

## XII. සභාව කල් තැබීම

**කේ.එච්.ඩී.කේ. සමරකෝන්,**
**ලේකම්,**
**බස්නාහිර පළාතේ පළාත් සභාව**

**2015.09.09 දින**
**සභා ලේකම් කාර්යාලය,**
**බස්නාහිර පළාතේ පළාත් සභාව,**
**5වන මහළ, B පර්යන්තය,**
**සෙත්සිරිපාය,**
**බත්තරමුල්ල.**